2019 වසර තුළ ශ්‍රී ලංකාව තුළ වාර්තා වූ දිවි අහිමි කරගැනීම් ප්‍රමාණය සොයා බැලුවහොත්, එම වසරේ පොලිස් වාර්තාවන්ට අනුව එය 3,135 කි. එනම් සාමාන්‍යය වශයෙන් දිනකට දිවි අහිමි කරගැනීම් 8.5 ක් සිදුවී ඇත.

සැබවින්ම දිවි අහිමි කරගැනීම් වසංගතයක් ලෙසින් පැතිර යා හැකි බව, ඒ සම්බන්ධයෙන් සිදුකළ පර්යේෂණ වලින් පැවසෙයි. මාධ්‍ය මගින් දිවි අහිමි කරගැනීම් පිළිබඳව වාර්තා කිරීමේදී ආචාර ධාර්මික හා උපරිමයෙන් ප්‍රවේසම් සහගත වීම අවශ්‍ය වනුයේ ඒ නිසායි.

දිවි අහිමි කරගැනීම් සම්බන්ධයෙන් වන මෙම ආචාර ධාර්මික වාර්තාකරණයට හදිසි උපකාරක අංක එවන් පුවත් වාර්තාවන් සමගින් සඳහන් කිරීමද අයත් වේ. විශේෂයෙන්ම, දිවි අහිමි කරගැනීම් පිළිබඳ පුවත් වාර්තාවක් හා හදිසි උපකාරක අංක පළ කිරීම ඔස්සේ, දිවි අහිමි කරගැනීමේ නැඹුරුතාවක් ඇති තවත් අයෙකුගේ දිවි බේරා ගැනීමට ඉඩක් ලැබෙනු ඇත.

මූලාශ්‍ර: ශ්‍රී ලංකා පොලිස් නිල වෙබ් අඩවිය, අපරාධ සංඛ්‍යාලේඛන (2019), ප්‍රවේශය: https://www.police.lk/index.php/item/138